3.10 ඉහත 3.5, 3.6, 3.7, 3.8, ඡේදයන්හි සඳහන් කරුණු සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනීම සඳහා අදාල කරුණු පිළිබඳ ලේකම්වරයාගේ නිරීක්ෂණ හා ඒ මත ලේකම්වරයාගේ නිර්දේශය වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමුකල යුතුය. එවැනි ඉල්ලීම් ලද විට තවදුරටත් පරීක්ෂා කර බලා තීරණයක් ලබා දීම හෝ අවශ්‍ය අවස්ථාවලදී මෙහි 9.1 වගන්තිය පරිදි කටයුතු කිරීම හෝ කරනු ලැබේ.

## 04. වාහනය පිළිබඳ සීමාවන්

මෙම චක්‍රලේඛය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍ර මගින් ඕනෑම සි.ර.ගැ. වටිනාකමකින් යුතු (සි.ර.ගැ. වටිනාකම් සීමාවන් නොමැතිව) සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ (H.S. Headings) 87.03 හෝ 87.04 යටතට අයත් මෙරටට ආනයනය කල හැකි වයස් සීමාව ඇතුලත වන මෝටර් රථ හෝ ඩබල් කැබ් රථ ආනයනය කිරීමට/දේශියව එකලස් කරනු ලබන වාහනයක් ලබා ගැනීමට බලපත්‍ර ලාභියාට හැකියාව පවතී.

## 05. ගෙවිය යුතු බදු ප්‍රමාණ

මෙම චක්‍රලේඛය යටතේ හෝ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 සහ එහි සංශෝධිත චක්‍රලේඛ යටතේ නිකුත් කර ඇති බලපත්‍රයක් මගින් නිලධාරියෙකු විසින් ඉහත අංක 4 හි සඳහන් සීමාවන් යටතේ ආනයනය කරනු ලබන මෝටර් රථ / කැබ් රථ සඳහා, මේ සම්බන්ධයෙන් මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නිකුත් කර ඇති 2018.02.15 දිනැති අංක 2058/34 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) ගැසට් පත්‍රයෙන් පනවා ඇති සහ එයට කලින් කලට සිදු කරනු ලබන සංශෝධන මගින් පනවනු ලබන බදු ප්‍රමාණයන් ශ්‍රී ලංකා රේගුව වෙත ගෙවිය යුතුය.

## 06. ලියාපදිංචිය හා පැවරීම පිළිබඳ කොන්දේසි

### 6.I ලියාපදිංචිය

මෙම චක්‍රලේඛය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් හෝ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 යටතේ නිකුත් කර ඇති බලපත්‍රයක් මගින් ලබා ගනු ලබන මෝටර් රථයක පළමු ලියාපදිංචිය බලපත්‍ර ලාභියා නමින් පමණක් සිදු කල යුතුය.

### 6.II පැවරීම

6.II.අ. මෙම චක්‍රලේඛය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ලබා ගන්නා මෝටර් රථයක් / කැබ් රථයක් එහි හිමිකරුගේ ඉල්ලීම මත ඕනෑම අවස්ථාවකදී වෙනත් පාර්ශවයකට පැවරීමට මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ට හැකියාව පවතින අතර වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 සහ එහි සංශෝධන යටතේ නිකුත් කල බලපත්‍රයක් මත ආනයනය කර මෙම චක්‍රලේඛයට අදාල වන බදු සහන යටතේ ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කර ගනු ලබන මෝටර් රථයක් / කැබ් රථයක් එහි හිමිකරුගේ ඉල්ලීම මත ඕනෑම අවස්ථාවකදී වෙනත් පාර්ශවයකට පැවරීමට මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ට හැකියාව පවතී.

6.II.ආ. වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 සහ එහි සංශෝධන යටතේ නිකුත් කල බලපත්‍රයක් මත ආනයනය කර වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 (II) හි සඳහන් බදු සහන යටතේ රේගුවෙන් නිදහස් කර ගන්නා මෝටර් රථයක් / කැබ් රථ වෙනත් පාර්ශවකට පැවරීමේදී එම චක්‍රලේඛයේ (01/2016 (II) හි) සඳහන් විධිවිධානයන් අදාල කර ගත යුතුය.

